ශ්‍රී ලංකා

ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ

පාර්ලිමේන්තුව

---

# 1983 අංක 4 දරන

# තණ බිම් (වෙන් කිරීමේ සහ සංවර්ධනය කිරීමේ) පනත

---

[සහතිකය සටහන් කළේ 1983 ජනවාරි මස 27 වන දින]

ආණ්ඩුවේ නියමය පරිදි මුද්‍රණය කරන ලදී.

---

1983 ජනවාරි මස 27 වැනි දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රයේ II වන කොටසේ අතිරේකයක් වශයෙන් පළ කරන ලදී.

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී

කොළඹ රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන් මිළ දී ලබාගත හැකිය

මිළ : ශත 45 යි　　　　තැපැල් ගාස්තුව : ශත 50 යි

# 1983 අංක 4 දරන තණ බිම් (වෙන් කිරීමේ සහ සංවර්ධනය කිරීමේ) පනත

[සහතිකය සටහන් කළේ 1983 ජනවාරි මස 27 වන දින]

එල්. ඩී.—ඕ. 29/76.

**ඇතැම් රජයේ ඉඩම් තණ බිම් වශයෙන් වෙන් කිරීම සඳහා ද එම ඉඩම් බදු දීම සඳහා ද එම ඉඩම්වල අවසර නොමැතිව සන්තකය දරන හෝ පදිංචිව සිටින තැනැත්තන්ගෙන් එම ඉඩම්වල සන්තකය ආපසු ලබා ගැනීම සඳහා ද ඊට සම්බන්ධ හෝ ආනුෂංගික කරුණු සඳහා ද විධිවිධාන සැලැස්වීම පිණිස වූ පනතකි.**

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ පාර්ලිමේන්තුව විසින් මෙසේ පනවනු ලැබේ:—

1. මේ පනත 1983 අංක 4 දරන තණ බිම් (වෙන් කිරීමේ සහ සංවර්ධනය කිරීමේ) පනත යනුවෙන් හඳුන්වනු ලැබේ. ලුහුඬු නාමය.

2. යම් රජයේ ඉඩමක් (මෙහි මින් මතු "තණ බිම" යනුවෙන් සඳහන් කරනු ලබන) තණ බිමක් වශයෙන් වෙන් කර තිබෙන බව ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නියමයක් මගින් අමාත්‍යවරයා විසින්, ඉඩම් විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව, කලින් කල ප්‍රකාශ කරනු ලැබිය හැකි ය. රජයේ ඉඩම් තණ බිම් වශයෙන් ප්‍රකාශයට පත් කිරීම.

3. පශු සම්පත් ඇති කරනු ව්‍යාපාරයෙහි නිරත වූ (මෙහි මින් මතු "බදු ගැනුම්කරු" යනුවෙන් සඳහන් කරනු ලබන) යම් රජයේ ආයතනයකට හෝ සංස්ථාවකට හෝ සංස්ථාගත නොකළ පුද්ගල මණ්ඩලයකට යම් තණ බිමක් කළමනාකරණය කිරීමට සහ සංවර්ධනය කිරීමට හැකියාව තිබේ යයි ඉඩම් කොමසාරිස්වරයා සෑහීමට පත්වන අවස්ථාවක, ඔහු විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙන ලද නිලධරයකු විසින්, (මෙහි මින් මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) සත්ත්ව නිෂ්පාදනය හා සෞඛ්‍යය පිළිබඳ අධ්‍යක්ෂවරයා විමසා, ඒ තණ බිම ඒ ආයතනයට හෝ පුද්ගල මණ්ඩලයට බදු දිය යුතු ය. ඉඩම් කොමසාරිස්වරයා වෙත පවරනු ලැබූ තණ බිම් බදු දීම.

4. (1) 3 වන වගන්තිය යටතේ යම් බදුගැනුම්කරුවකු සමඟ ඇතුළත් වූ යම් බදු ගිවිසුමක්— යම් බදු ගිවිසුමක් අවසන් කිරීමට ඉඩම් කොමසාරිස්වරයා හෝ බලයලත් නිලධරයා සතු බලය.

(අ) ඒ බදු ගිවිසුමේ අඩංගු නියමයන් හා කොන්දේසි පිළිපැද නොමැති බවට; හෝ

(ආ) ඒ බදු ගිවිසුමට යටත් වන තණ බිමෙන් උපරිම ලෙස ප්‍රයෝජනය ගෙන නොමැති බවට

ඉඩම් කොමසාරිස්වරයා හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙන ලද නිලධරයකු සෑහීමට පත්වන අවස්ථාවක, ඉඩම් කොමසාරිස්වරයා විසින් හෝ ඒ නිලධරයා විසින්, අධ්‍යක්ෂවරයා විමසා, නියමයක් මගින් ඒ බදු ගිවිසුම අවසන් කළ යුතු ය.

(2) බදු ගැනුම්කරුවකුට විරුද්ධව (1) වන උපවගන්තිය යටතේ නියමයක් කිරීමට පෙර ඒ නියමය නොකළ යුත්තේ මන්දැයි ඔහු වෙත යවනු ලබන දැන්වීමෙහි සඳහන් කාල සීමාව ඇතුළත හේතු දැක්වීම පිණිස ඒ දැන්වීම යවනු ලැබීමෙන් පසුව හා ඒ කාලසීමාව ඇතුළත එසේ හේතු දැක්වීමට ඔහු පැහැර හැරියහොත් හෝ ඔහු විසින් ප්‍රමාණවත් හේතු පෙන්වනු නොලැබුවහොත් මිස ඒ නියමය නොකළ යුතු ය.

2-ඒ 66530—11,750 (82/11)

**1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනත අදාළ වන බව.**

5. 1981 අංක 58 දරන පනතින් සංශෝධිත, 1979 අංක 7 දරන රජයේ ඉඩම් (සන්තකය ආපසු ලබා ගැනීමේ) පනතේ අර්ථානුකූලව, සියලුම තණ බිම් රජයේ ඉඩම් ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ තණ බිමක අවසර නොමැතිව සන්තකය දරනු හෝ පදිංචි වී සිටින යම් තැනැත්තකු නෙරපීම සඳහා ඒ පනතේ විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව, අදාළ විය යුතු ය.

**ලේඛන පවත්වාගෙන යාම.**

6. මේ පනත යටතේ වූ සෑම බදු ගැනුම්කරුවකු විසින් ම, නියමිත ලේඛන පවත්වාගෙන යා යුතු අතර, නියමිත වාර්තා ඉඩම් කොමසාරිස්වරයා හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙන ලද නිලධරයකු වෙත සහ අධ්‍යක්ෂවරයා වෙත යැවිය යුතු ය.

**ඇතුළුවීමේ හා පරීක්ෂා කිරීමේ බලය.**

7. ඉඩම් කොමසාරිස්වරයා විසින් හෝ ඔහු විසින් ලියවිල්ලකින් බලය දෙන ලද නිලධරයකු විසින් හෝ අධ්‍යක්ෂවරයා විසින් හෝ—

(අ) මේ පනතේ විධිවිධාන හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝග පිළිපදිනු ලබන්නේ දැයි නිසැකව දැන ගැනීමේ කාර්යය සඳහා, දවල් කාලයේ සියලුම සාධාරණ වේලාවන්හි දී යම් තණ බිමකට ඇතුළු වී, පරීක්ෂා කළ හැකි ය; තව ද

(ආ) මේ පනත යටතේ හෝ ඒ යටතේ සාදනු ලැබූ යම් නියෝග යටතේ හෝ යම් බදු ගැනුම්කරුවකු විසින් තබා ගත යුතු බවට නියම කරනු ලැබ ඇති යම් ලේඛන පරීක්ෂා කොට ඒ ලේඛනවල පිටපත් ලබා ගත හැකි ය.

**2 වන වගන්තිය යටතේ නියමයක් අමාත්‍යවරයා විසින් ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි බව.**

8. තණ බිමක් වශයෙන් වෙන් කර තිබෙන බව ප්‍රකාශිත යම් ඉඩමක් එලෙස තණ බිමක් වශයෙන් තිබීම නුසුදුසු යයි අමාත්‍යවරයා අදහස් කරන අවස්ථාවක, 2 වන වගන්තිය යටතේ කරනු ලැබූ නියමය ඉඩම් පිළිබඳ විෂයය භාර අමාත්‍යවරයාගේ එකඟත්වය ඇතිව ඔහු විසින් ප්‍රත්‍යාදිෂ්ට කළ හැකි ය.

**මේ පනත යටතේ වැරදි හා දණ්ඩන.**

9. යම් තණ බිමක සීමා ඇතුළත—

(අ) නීත්‍යනුකූල බලය නොමැතිව යම් ගස් කපන, [illegible]; හෝ

(ආ) නීත්‍යනුකූල බලය නොමැතිව ගවයකුට තණ කවන; හෝ

(ඇ) හිතාමතාම ඒ ඉඩමට යම් අලාභයක් සිදු කරන හෝ එහි බදුගැනුම්කරුවන්ට යම් අලාභයක් සිදු කරන; හෝ

(ඈ) අයුතු ලෙස ඇතුළුවන; හෝ

(ඉ) එහි ඇති ස්වාභාවික ජල මාර්ගවල අයුතු යමක් කරන; හෝ

(ඊ) බලයලත් තැනැත්තන් ඇතුළුවන විට ඔවුන්ට බාධා පමුණුවන; හෝ

(උ) බෝවෙන රෝගවලින් පෙළෙන සතුන් ඇතුළු කරන,

යම් තැනැත්තකු වරදක් කරන අතර, මහේස්ත්‍රාත්වරයකු විසින් වරදකරු කරනු ලැබූ විට රුපියල් දෙසිය පනහකට

නොඅඩු සහ රුපියල් එක් දහසකට නොවැඩි දඩයකට හෝ එක් අවුරුද්දක් නොඉක්මවන කාලයක් සඳහා බන්ධනාගාරගත කිරීම කට හෝ ඒ දඩය හා බන්ධනාගාරගත කිරීම් යන දෙකටම හෝ ඔහු යටත් විය යුතු ය.

10. (1) මේ පනතේ නියමිත කරුණු සම්බන්ධයෙන් අමාත්‍ය **නියෝග.** වරයා විසින් නියෝග සෑදිය හැකි ය.

(2) පහත දැක්වෙන කරුණු සියල්ලම හෝ ඒවා අතුරෙන් යම් කරුණක් සම්බන්ධයෙන් විශේෂයෙන් නියෝග සාදනු ලැබිය හැකි ය :—

(අ) මේ පනත යටතේ ඇතුළත් වූ බදු ගිවිසුම්වල නියමයන් හා කොන්දේසි ;

(ආ) බදුගැනුම්කරුවන් විසින් පවත්වාගෙන යා යුතු නිෂ්පාදනයේ ප්‍රමිති ;

(ඇ) බදුගැනුම්කරුවන් විසින් ලේඛන පවත්වාගෙන යා යුතු ආකාරය.

(3) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම ගැසට් පත්‍රයේ පළ කරනු ලැබිය යුතු අතර, එය පළ කරනු ලැබූ දින සිට හෝ නියෝගවල සඳහන් කරනු ලබන යම් පසු දිනක සිට ක්‍රියාත්මක විය යුතු ය.

(4) අමාත්‍යවරයා විසින් සාදනු ලබන සෑම නියෝගයක්ම, එය ගැසට් පත්‍රයේ පළ කිරීමෙන් පසු හැකි පහසු ඉක්මණින්, අනුමතය සඳහා පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු ය.

(5) එසේ අනුමත කරනු නොලැබූ යම් නියෝගයක්, අනුමත කරනු නොලැබූ දින සිට, පරිච්ඡින්න කරනු ලැබූ ලෙස සැලකිය යුතු නමුත් ඒ යටතේ කලින් කරන ලද යම් කිසිවකට ඉන් හානියක් නොවිය යුතු ය.

(6) යම් නියෝගයක් යම් දිනයක එසේ පරිච්ඡින්න කරනු ලැබී යයි සලකනු ලබන්නේ ද, ඒ දිනය ගැසට් පත්‍රයේ පළ කළ යුතු ය.

11. පද සම්බන්ධයෙන් අන්‍යාර්ථයක් අවශ්‍ය වුවහොත් මිස, මේ **අර්ථ නිරූපණය.** පනතෙහි—

"සත්ව නිෂ්පාදනය හා සෞඛ්‍යය පිළිබඳ අධ්‍යක්ෂවරයා" යන්නට නියෝජ්‍ය අධ්‍යක්ෂවරයකු සහ සහකාර අධ්‍යක්ෂවරයකු ද ඇතුළත් වේ.

Annual subscription of Bills and Laws of the Parliament Rs. 30 (Local), Rs. 40 (Foreign), payable to the SUPERINTENDENT, GOVERNMENT PUBLICATIONS BUREAU, P. O. Box 500, COLOMBO 1, before 15th December each year in respect of the year following. Late subscriptions will be accepted on the conditions that Bills and Laws issued before the date of payment will not be supplied.